ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## <u>පුවත්පත් නිවේදනය</u>

# කොළඹ දීපාවලි **ආලෝකයෙන් ඒකාලෝක** වේ: එකමුතුබව, උරුමය සහ ප්‍රීතිය සැමරේ

ආලෝකයේ උළෙල වන දීපාවලිය සැමරීම සඳහා 2025 ඔක්තෝබර් 17-20 වන දින දක්වා කොළඹ දී විචිත්‍රවත් වැඩසටහන් රැසක් සංවිධානය කර තිබූ අතර ඉන්දීය ඩයස්පෝරාව සහ ශ්‍රී ලාංකික මිතුරු මිතුරියෝ එම වැඩසටහන් සඳහා සහභාගී වූහ. මෙම සැමරුම් තුළින් උත්සවයේ ප්‍රීතිය සහ ආධ්‍යාත්මික පැතිකඩ පමණක් නොව ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින ගැඹුරු සංස්කෘතික සබඳතා ද පිළිබිඹු විය.

2. ඉන්දීය සංස්කෘතික සංගමය සහ කොළඹ, ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය විසින් ඔක්තෝබර් 17 වන දින සංවිධානය කර තිබූ දීපාවලි උත්සවයකින් සැමරුම් ආරම්භ විය. නේක විධ ආලෝකයන් සහ සැරසිලිවලින් අලංකෘත වූ මෙම උත්සවය සාම්ප්‍රදායික සංගීතය, නර්තන සහ ප්‍රණීත ඉන්දීය ආහාර පානවලින් සමන්විත විය. මහ කොමසාරිස්තුමා ද ඉන්දීය ඩයස්පෝරාව සමඟ උත්සව ප්‍රීතිය සැමරීමට එක් විය. ශ්‍රී ලාංකේය ගායන ශිල්පී නිමන්ත හේෂාන් ගමගේ විසින් ඉදිරිපත් කරන ලද ජව සම්පන්න බොලිවුඩ් ගායනයන්ගෙන් මෙන්ම කොළඹ අහස හැඩ කළ ගිනි කෙළි සංදර්ශනයකින් ද උළෙල අලංකෘත විය.

3. COLIND (කොළම්බු ඉන්දියන්ස්) සංගමය සහ ඉන්දීය ප්‍රධාන විධායක නිලධාරීන්ගේ සංසදය විසින් ඔක්තෝබර් 18 වන දින තවත් දීපාවලී උත්සවයක් ටාජ් සමුද්‍ර හෝටලයේ දී මහත් උත්කර්ෂවත් අයුරින් පවත්වන ලදී. හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය විජිත හේරත්, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍ය සුනිල් හඳුන්නෙත්ති, කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය අනිල් ජයන්ත ප්‍රනාන්දු, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය චතුරංග අබේසිංහ යන අමාත්‍යවරු, රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන්, කලා සහ ක්‍රීඩා තරු, ව්‍යාපාරික ක්ෂේත්‍රයේ නායකයන් සහ ඉන්දීය ප්‍රජාව ඇතුළු අමුත්තන් රැසක් සහභාගී වූ මෙම වැඩසටහන ඉන්දියා - ශ්‍රී ලංකා සංස්කෘතික සමඟිය සහ සහෝදරත්වය පිළිබිඹු කළේය. ප්‍රශාදි නර්තන ඇකඩමියේ ශ්‍රී ලාංකේය නර්තන ශිල්පීන් සහ ශිල්පිනියන් සහ ජනප්‍රිය ගායන ශිල්පිනී උමාරා සිංහවංශ සිය ඉදිරිපත් කිරීම් සමඟින් පැමිණ සිටි පිරිස අමන්දානන්දයට පත් කළේ

දෙරට අතර සංස්කෘතික සබැඳියාව මනාවට විදහාපාමිනි. මෙම අවස්ථාව අමතමින් මහ කොමසාරිස්තුමා ආදයම් බදු සහ භාණ්ඩ සහ සේවා බදු (GST) අඩු කිරීම ඇතුළු ඉන්දියාවේ මෑත කාලීන ආර්ථික ප්‍රතිසංස්කරණ ඉන්දියාව පුරා උත්සව සමයේ සාප්පු සවාරි සඳහා යහපත් වටපිටාවක් නිර්මාණය කරමින් වෙළෙඳපොළ ක්‍රියාකාරකම් සඳහා ද දීපාවලි සමය තුළ පාරිභෝගිකයන්ගේ සුබවාදීභාවය ඉහළ නැංවීමට ද දායකත්වය ලබා දුන් බව ප්‍රකාශ කළේය.

4. මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා සහ තනුජා ජා මහත්මිය ඉන්දිය මහ කොමසාරිස් කාර්යාල පරිශ්‍රයේදී ඉන්දිය මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන් සඳහා ඔක්තෝබර් 20 වන දින දීපාවලි උත්සවයක් පැවැත්වූහ. නිලධාරීහු සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයෝ උණුසුම් සහ ප්‍රීතිමත් අයුරින් දීපාවලිය සැමරුවෝ නිවසින් දුරක සිට නිවසක හැඟීම විඳගනිමිනි. උත්සවය සාම්ප්‍රදායික චාරිත්‍ර වාරිත්‍ර සහ සැරසිලිවලින් ද සමන්විත විය.

5. මෙම දීපාවලි සැමරුම් ප්‍රජාවේ එකමුතුභාවය වර්ධනය කළ අතර එතුළින් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර අචල මිත්‍රත්වය සහ සංස්කෘතික සුසංයෝගය ද සමරන ලදී.

***

*කොළඹ*
*2025 ඔක්තෝබර් 22*